**සූරියවැව ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

-------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට සූරියවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කරන බව හෙළිදරව් කර තිබුණද ආයෝජන පොලී මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගෙන තිබුණු හා පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු. 131,547 ක වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) ජල බවුසරයේ වටිනාකම රු. 15,714 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ දරා තිබූ එකතුව රු. 11,074 ක් වූ පුනරාවර්තන වියදම් ප්‍රාග්ධන වත්කම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් විෂයයන් 2 කට අදාළ ශේෂ සහ ඊට අදාළ උපලේඛන වල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 267,563 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

**1.3.4 අවිනිශ්චිත ගිණුම්**

ඉකුත් වර්ෂයේ අවසානයට රු. 589,543 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.5 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) **ලැබිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට ජල පාරිභෝගිකයින් 300 දෙනෙකුගෙන් රු. 403,454 ක ජල බිල්පත් ගාස්තු අයවිය යුතුව තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

i. සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ ණයහිමි සහ කර්මාන්ත ණයහිමි ශේෂ පිළිවෙලින් රු. 1,207,976 ක් සහ රු. 15,170,137 ක් වූ අතර, එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ii. 2016 දෙසැම්බර් 31 දිනට සභාවේ බේරුම් නොකල බැරකම් වල මුළු එකතුව රු. 16,466,967 ක් විය.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු. 18,600,000 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු/ පැවරුම් නියෝග ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.7 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත විස්තර දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැයගත ප්‍රතිපාදන හා පරිපූරක සම්මත සමඟ සසඳා එක් එක් ආදායම් විෂයයන් හා වැය විෂයය යටතේ වන අතිරික්තයන් සහ ඌනතාවයන් පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | 2013 හා 2014 වර්ෂ වලට අදාළව කල් ඉකුත්වී තිබුණු එකතුව රු. 264,239 ක් වූ කර්මාන්ත රැඳවුම් මුදල් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PFD/RED/2015/ 08 පොදු (i) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂවරයාගේ ලිපියේ 4.3 (ඉ) වගන්තිය | සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 73,600 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 6,657,170 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු. 471,652ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 7,128,822 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම, මුළු පුනරාවර්තන ආදායමෙන් සියයට 87 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණු අතර, එය මූල්‍ය කලමනාකරණය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව විගණනයේ අදහසයි.

(ආ) සෑම වර්ෂයකම ආදායම් ආධාර ලැබීම් වල වර්ධනයක් පෙන්නුම් කෙරෙන නමුත්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ස්වයං උත්පාදන ආදායම් වල පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.3 ආදායම් පරිපාලනය

----------------------

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය පිළිබඳ පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව බිල්කර තිබුණු රු. මිලියන 6.46ක ආදායමින් රු. මිලියන 3.08 ක් රැස් කර තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 48 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු ආදායම් වල එකතුව රු. මිලියන 2.99 ක් වූ අතර, එයින් රු. මිලියන 0.78 ක් අය කර ගෙන තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය සියයට 26 ක් විය.

**2.3.2 බදු කුලී**

(අ) කඩ කාමර කුලී

සභාවට අයත් කඩ කාමර 40 කින් 2016 දෙසැම්බර් 31 දිනට රු. 847,550 ක කුලී හා රු. 91,005 ක ප්‍රමාද ගාස්තු අයවීමට තිබුණි. එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) එක්වන් මුදල්

i. 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 4 ඡේදයට අනුව එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 350,992 ක එක්වන් මුදල් අයවිය යුතුව තිබුණි.

ii. සූරියවැව සතිපොළ අසල කඩ කාමර 26 පේලියේ කඩහිමියන් හත් දෙනෙකුගෙන් සහ සූරියවැව බස් නැවතුම්පොළ අසල කඩ හිමියෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 292,592 ක් වූ එක්වන් මුදල් 2011 වර්ෂයේ සිට හිඟව පැවතුණි.

(ඇ) ලිඛිත ගිවිසුම් වලට එළඹීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තියෙහි සඳහන් විධිවිධාන වලට අනුව ලිඛිත ගිවිසුම් වලට එළඹීමකින් තොරව සභාවට අයත් කඩකාමර 04 ක් බදුදී තිබුණි.

**2.3.3 බලපත්‍ර ගාස්තු**

ව්‍යාපාර ඒකක 61 කින් අයවිය යුතු රු. 38,250 ක වෙළඳ බදු හා බලපත්‍ර ගාස්තු හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149,150,151 හා 152 යන වගන්ති වල සඳහන් විධි විධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 2,621,656 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 189,000 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------

**3.1.1 වීථි පහන් නඩත්තුව**

--------------------

2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව, විදුලිබල මණ්ඩලය වෙත අයදුම් කර බලප්‍රදේශය තුළ ස්ථාපනය කර ඇති වීථි පහන් විධිමත් කර නොගැනීම නිසා සභා අරමුදලින් නඩත්තු කරන වීථි පහන් 1583 න් 531 ක් සඳහා පමණක් ගාස්තු ප්‍රතිපූර්ණය කර තිබුණි.

**3.1.2 පවරා නොගත් වත්කම්**

------------------------

සභාව විසින් භාවිතයට යොදවාගෙන ඇති ඉඩම් 8 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට අදාළ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම වී නොතිබුණි.

**3.2 නිෂ්ක්‍රීය වත්කම්**

-----------------

2016 ජුනි මස ධාවනයෙන් ඉවත්කර තිබූ පිරිවැය රු. 625,000 ක් වූ කැබ් රථය අලුත්වැඩියා කර ධාවනයට යොදවා ගැනීමට 2017 මාර්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.3 සූරියවැව මාළු වෙළඳපොළ ඉදිකිරීම**

-------------------------------------

පුර නැගුම ව්‍යාපෘතිය යටතේ 2016 පෙබරවාරි මාසය වන විට ඉදිකිරීම් අවසන් කර තිබූ මාළු වෙළඳපොල 2017 මාර්තු 31දින වන විටත්, ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා විවෘත කර නොතිබුණි.

**3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් එකතු කරනු ලබන කසළ වලින් කොටසක් මදුනාගල ප්‍රදේශයේ පිහිටි අක්කර 05 ක පමණ භූමියකට වසර 13 ක පමණ කාලයක සිට අවිධිමත්ව බැහැර කිරීමෙන් ප්ලාස්ටික්, වීදුරු, මැටි භාජන, ටයර් වල ජලය එක් රැස් වී තිබූ අතර, එතුළින් මැසි මදුරුවන් ඇතුළු රෝග කාරක කෘමීන්ගේ ගහනය වැඩි වීමට ඉඩකඩ සැලසී තිබුණි.

(ආ) භූමියෙහි එක් කොටසක් කසළ පිලිස්සීමට යොදා ගෙන තිබුණු අතර, එමඟින් පරිසරයට අහිතකර වායුමුදා හැරෙන්නේද යන්න පිළිබඳව සහ විකිරණශීලී අපද්‍රව්‍ය මගින් පරිසරයට මෙන්ම ජීවින්ට ඇති විය හැකි අවධානම පිළිබඳව අවධානය යොමු නොකර, විවෘත භූමියට එම ද්‍රව්‍ය බැහැර කර තිබුණි.

(ඇ) භූමිය වටා ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබුණු බැවින් අලි ඇතුන්, ගවයන් හා අනෙකුත් වන සතුන් කසළ අංගනයට ඇතුළු වී තිබුණු අතර, බාහිර පාර්ශවයන් විසින්ද මෙම භූමියට කසළ බැහැර කර තිබුණි.

(ඈ) රැස් කරන කසළ භාවිතයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ කටයුතු 2017 පෙබරවාරි 08 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. කොම්පෝස්ට් ව්‍යාපෘතියේ දැල් වැට සඳහා 2011 දෙසැම්බර් 30 දින මිලදී ගෙන තිබුණු භාණ්ඩ වලින් පිරිවැය රු. 101,500 ක් වූ කොටසක් අස්ථානගතවී තිබූ අතර, තවත් කොටසක් ප්‍රාදේශීය සභා පරිශ්‍රය පිහිටි ඉඩම වටා වැට සකස් කිරීමට හා ගරාජය ඉදිකිරීම සඳහා යොදා ගෙන තිබුණි.

## 3.5 කාර්යය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ අවසානයට අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා තනතුරු 6 ක සේවකයින් 12 දෙනෙකුගේ අතිරික්තයන් හා තවත් තනතුරක පුරප්පාඩුවක් පැවතුණි. අතිරික්ත තනතුරු විධිමත්කර ගැනීමට මෙන්ම පුරප්පාඩුව පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4. යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය

### අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 49 ක එකතුව රු. 5,265,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනද, තවත් වියදම් විෂයයන් 05 ක එකතුව රු. 27,545,396 ක් වූ ඉතිරිකිරීම්ද ආදායම් විෂයයන් 03 ක ළඟාකර නොගත් එකතුව රු. 14,958,734 ක ඉලක්කයන්ද නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) සේවක මණ්ඩල කළමනාකරණය
(ඈ) අයවැය පාලනය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය